දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/06-01-13/04/2019

ඔබේ අංකය
உமது இல.
Your No.
NTA/06/MSA/අන්.ග්‍/12/2017

දිනය
திகதி
Date
2019.12. 03

06 DEC 2019

SECRETARY 74545 06 DEC 2019 Ministry of Health & Indigenous Medicine

ලේකම්

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

**ගබඩා භාරකරු තනතුරේ සිට වෛද්‍ය සැපයීම් සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කළ නිලධාරීන්ට උසස්වීම් ලබා දීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2019.11.06 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019.11.29 දින සහතික කරන ලද, මෙම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය ඛණ්ඩ 1 සේවා ශ්‍රේණිය සඳහා වන උසස් කිරීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ උසස් කිරීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්

1. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - මුල් පිටපත මේ සමඟ එවමි.
2. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - මුල් පිටපත මේ සමඟ එවමි.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බහුකාර්ය ඛණ්ඩ 1 සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : අදාළ නොවේ

1.2 අමාත්‍යාංශය : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය

යොමු අංකය: NTA/06/MSA/අන්.ග්‍ර/12/2017 දිනය : 2019.07.05

1.3 කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය :DMS/0016/VoLJ/2018 දිනය : 2018.04.11

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරදේශය : යොමු අංකය:EST-2/02/REC/0946 දිනය: 2019.09.05

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය:NSCC/4/13/SR-4 දිනය: 2019.09.23

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය:PSC/EST/06-01-13/03/2019 දිනය: 2019.10.24

02.පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්

03.සේවා ගණය පිළිබඳ විස්තරය

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය ඛණ්ඩ I

3.2 ශ්‍රේණි : III, II හා I

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :පරිපාලන, කළමනාකරණ සහ විධායක ශ්‍රේණිවලට සිය රාජකාරි ඉටු කිරීමෙහි ලා පහසුව හා සහාය සැලසීමේ කාර්යයන්හි සහාය දැක්වීමේදී තාක්ෂණික නිපුණතාවයක් අවශ්‍ය නොවන බහුවිධ කාර්යයන් සේවක ගණයට පැවරේ. මෙම සේවා ගණයේ කාර්යයන් අතරින් පත්වීම් බලධරයා විසින් තනතුරට අදාළ විශේෂයෙන් නියම කොට දක්වනු ලබන කාර්යයන් මෙම නිලධාරින් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම :ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකෙරන බැවින් මෙම තනතුරට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යභාරයක් ඕනෑම ශ්‍රේණියක නිළධාරියකුට පැවරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN-2-2016(ඒ)

5.2 වැටුප් පරිමාණය : රු.28,940-10 x 300 – 11 x 350– 10 x 560 – 10 x 660- 47,990

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු.28,940 |
| II | පියවර 12 | රු.32,290 |
| I | පියවර 23 | රු.36,350 |

කාබද්ධ නිලධර සංඛ්‍යාව

06. සේවා ගණයට අයත් තනතුරු :

6.1 අනුමත තනතුරු නාමය, අනුමත තනතුරු සංඛ්‍යාව හා පැවරෙන කාර්යයන් :

| අනු අංකය | අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| 01 | වෛද්‍ය සැපයීම් සහකාර | 10 | • තම ගබඩා අංශයේ සුරක්ෂිතභාවය ගැන වගකීම, ලැබෙන බඩු ඉල්ලුම්පත් අනුව තම අංශයේ සහකාර අධ්‍යක්ෂවරයාගේ උපදෙස් පරිදි ඒවා බෙදා හැරීම් අංශයට යැවීම.<br>• ඖෂධ සංයෝජනය හා රසායනික සංයුතිය සුරක්ෂිත කිරීමේ තාක්ෂණික කටයුතු කිරීම හා වගකීම.<br>• අන්තරාදායක හා විකිරණශීලි පිළිකා මර්දන ඖෂධ, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අන්තරාදායක ඖෂධ පනතට අනුව, බෙදා හැරීමට හා ගබඩා කිරීමට වගබලා ගැනීම.<br>• ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් මත සුවිශේෂි ගබඩා ක්‍රමවේදයක් හා තාක්ෂණික දැණුම උපයෝගී කර ගනිමින් ළමා හා මාතෘ සායන සඳහා නිර්දේශිත වැක්සීන් (Vaccine) වල රසායනික සංයුතිය හා ගුණාත්මක භාවයට හානි නොවන අයුරින් විශේෂිත තාක්ෂණික ක්‍රමවේදයන් යටතේ ගබඩා කිරීමේ සහ නිකුත් කිරීමේ වගකීම.<br>• ලංකාවේ සියළුම පළාත් වල රෝහල් හා සෞඛ්‍ය ආයතන සඳහා වාර්ෂික තොග ඇස්තමේන්තු සැකසීමේ හා තොග පාලන කටයුතු කිරීම.<br>• නවීන ගබඩා යන්ත්‍රෝපකරණ හා ඖෂධ ප්‍රවාහනය සඳහා යෝග්‍ය වාහන සකස් කිරීම.<br>• ඖෂධ හා ඇසුරුම් ගබඩා වලට ලැබෙන අන්දමට අට්ටි ගැසීම, කලින් ගෙන්වන ලද භාණ්ඩ (ද්‍රව්‍ය) පළමුව නිකුත් කිරීමට වගබලා ගැනීම හා නිෂ්පාදිත භාණ්ඩ අංක හා කල් ඉකුත්වීමේ දින අනුව නිකුත් කිරීම.<br>• ශල්‍ය උපකරණ ගබඩා කිරීම හා ඉල්ලුම්පත් අනුව අංශභාර සහකාර අධ්‍යක්ෂවරයාගේ උපදෙස් පරිදි බෙදා හැරීම.<br>• අක්‍රමිකතා වංචා දූෂණ ඇති නොවන පරිදි ක්‍රමවත්ව සුරක්ෂිත අන්දමින් ගබඩාව තුළ මනා පරිපාලනයක් පවත්වාගෙන යාම සහ ඒ සම්බන්ධව තම අංශභාර සහකාර අධ්‍යක්ෂවරයාට වගකීම.<br>• ලැබීම් හා නිකුත් කිරීම් ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා ලෙජරගත කිරීම සහ ඒවා ලැබීම්, නිකුත්කිරීම් සටහන් කර මාසිකව තුලනය කිරීම.<br>• අවශ්‍ය බිල් කාඩ්පත් ලියකියවිලි, පොත්පත් හා ලිපිගොණු ආදිය අතපසු නොකර නියමිත ලෙස තබාගැනීම.<br>• ගබඩා සමීක්ෂණ වලදී සමීක්ෂණ නිළධාරින්ට සහායවීම හා විමසුම් ඇතොත් කලට වේලාවට ඒවාට පිළිතුරු සැපයීම.<br>• අංශ වෙත ලැබෙන ඖෂධ වල දින ඉකුත් වීමට ප්‍රථම ඒවා නියමිත අන්දමට අදාළ ආයතනවලට නිකුත් කිරීමට වගබලා ගැනීම හා එවැනි කාලය ඉකුත්වීමේ තොග තම අංශය තුළ ඇත්නම් ඒවා පිළිබඳ දැන්වීමට කටයුතු කිරීම.<br>• තම අංශයේ ඖෂධ තොග අවම මට්ටමක පැමිණ ඇත්නම් එම ඖෂධ පිළිබඳව මසකට වරක් සහකාර අධ්‍යක්ෂ (සැපයීම්) වෙත වාර්තා කිරීම.<br>• ආයතනය භාර නිළධාරියාගේ අභිමතය පරිදි සාධාරණ ලෙස පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |

6.2.ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : වෛද්‍ය සැපයීම් සහකාර - 10
ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II, හා I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්:

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුක්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලා/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත - ඇමුණුම - 01 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත - ඇමුණුම - 02 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත - ඇමුණුම - 03 |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිළධාරින් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබාගත යුතුය. |
| 02.අනෙත් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

**10.1** III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස්වීම් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම.
vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.2.1 (ආ) **උසස්වීමේ ක්‍රමය :** සුදුසුකම් සම්පූර්ණ කරන නිළධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිළධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**10.1.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් උපයාගෙන තිබීම.
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අනුමත කාර්යසාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**10.2.1.2 උසස්කිරීමේ ක්‍රමය:** සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිළධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**11.** තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ.

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:

I. සේවයේ යෙදවීම, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ කොන්දේසි සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති I කාණ්ඩයේ විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන විධිවිධාන අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපනය:

**"සක්‍රිය සේවා කාලය"** යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින්, සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14.** ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය - "ඇමුණුම 4"

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**16.** මෙම බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : -

අත්සන ...................

කේ. එච්. ටී. ඩී. කුමාරසිංහ
අධ්‍යක්ෂ (පාලන) 03 (ශ්‍රී.ලං.ප.සේ.III)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය 2019/10/31

පරීක්ෂා කළේ : -

අත්සන ...................

(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරියා)

ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ...................

(සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්)

නම :
තනතුර :
නිල මුද්‍රාව :

වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවං... මාවත,
කොළඹ 10.

යොමු අංකය:NTA/06/MSA/අන්.ග්‍ර/12/2017

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන: ...................

නම: ...................

ලේකම්.
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

වැඩ බලන ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය 2019/11/01

නිල මුද්‍රාව:

බී. එම්. හිමල් බාලසූරිය
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය
රාජ්‍ය අමාත්‍යාංශය

යොමු අංකය: PSC/EST/06-01-13/03/2019

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2019.10.24 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන: ...................

නම: එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්.
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය 2019.11.29

නිල මුද්‍රාව:

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ඇමුණුම 01

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ -1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය.

01. විභාගය :- කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ - 1 සේවා ගණය සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තරය :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. කාර්යාල ක්‍රම | පැය 02 | 100 | 40% |
| 02. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : - සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :- වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

01.පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

| ප්‍රශ්න පත්‍රේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01.කාර්යාල ක්‍රම | ආයතන සංග්‍රහයේ,<br>VI පරිච්ඡේද - වැටුප්<br>XII පරිච්ඡේද - නිවාඩු<br>XIII පරිච්ඡේද - දුම්රිය බලපත්<br>XIV පරිච්ඡේද - දිවයින ඇතුළත රාජකාරි<br>XXIV පරිච්ඡේද - වැටුප්, ණය සහ අත්තිකාරම්<br>XXXII පරිච්ඡේද - දේශපාලන අත්තිකාරම් භුක්ති විඳීම<br>XLVII පරිච්ඡේද - සාමාන්‍ය හැසිරීම හා විනය<br>XXVII පරිච්ඡේද - ලිපි ගණුදෙනු කිරීමේ පරිපාටිය<br>XXVIII පරිච්ඡේද - පරිපාලන කාර්ය පරිපාටිය සහ විධි<br><br>* රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ :-<br><br>III වැනි පරිච්ඡේදය - පත් කිරීම්<br>V වැනි පරිච්ඡේදය - රජයේ සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන්<br>VI වැනි පරිච්ඡේදය - පත්කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි<br>VII වැනි පරිච්ඡේදය - පත්කිරීම් වලදී අනුගමනය කළයුතු පරිපාටිය<br>VIII වැනි පරිච්ඡේදය - පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම් ස්ථිර කිරීම<br>XIV වැනි පරිච්ඡේදය - පත්වීම අවසන් කිරීම හා රජයේ සේවයෙන්<br>XV වැනි පරිච්ඡේදය - තනතුර අතහැර යාම |

| | |
|---|---|
| 02.මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි,<br>I පරිච්ඡේද - වියදම් හා අදායම් ඇස්තමේන්තු<br>II පරිච්ඡේද - වියදම්, අත්හැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාරි බලය<br>III පරිච්ඡේද - මුදල් පාලනය හා ගිණුම්ගත කළ හැකි වීම.<br>IV පරිච්ඡේද - ලැබීම්<br>V පරිච්ඡේද - ගෙවීම්<br>* රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය. |

සටහන - උසස්වීමේ වීමේ පරිපාටිය අනුමත වූ දිනට මෙම තනතුරේ අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධරයන් එම තනතුරට අදාළ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයෙන් (1 වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයෙන්) නිදහස් කරනු ලැබේ. (උසස්වීමේ වීමේ පරිපාටිය අනුමත වූ දිනට පෙර අදාළ තනතුරට පත්වීම් ලබා III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිළධරයන් මේ සඳහා සුදුසුකම් ලබයි.)

සකස් කළේ :-
අත්සන ..................

කේ. එච්. ටී. ඩී. කුමාරසිංහ
අධ්‍යක්ෂ (පාලන) 03 (ශ්‍රී.ලං.ප.සේ.III)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය...2019/10/31

පරික්ෂා කළේ : -
අත්සන ..................................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ..........................................................
(සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්)
නම : වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
තනතුර : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
නිල මුද්‍රාව: "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

යොමු අංකය:NTA/06/MSA/අන්.ග්‍ර/12/2017

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන:.................. වැඩ බලන ලේකම් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය"
නම: .................. 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.
ලේකම්.
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

දිනය..2019/11/06..........

නිල මුද්‍රාව: ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

~~යොමු අංකය~~:..........................................

~~සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය .................. දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.~~

~~අත්සන~~:..........................................
~~නම~~: ..........................................
~~ලේකම්.~~
~~රාජ්‍ය සේවා කොමිෂන් සභාව~~

~~දිනය~~..........................

~~නිල මුද්‍රාව~~:

<u>ඇමුණුම 02</u>

<u>සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි</u>

**<u>කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය.</u>**

01. විභාගය :- කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 1 සේවා ගණය සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තරය :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. පරිගණක පරීක්ෂණය | පැය 01 1/2 | 100 | 40% |
| 02. මුදල් රෙගුලාසි | පැය 01 1/2 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : - සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :- වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

<u>01.පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

| ප්‍රශ්න පත්‍රෙය් නම | විෂය නිර්දේශය |
|---|---|
| 01.පරිගණක තාක්ෂණය | පහත හැකියාවන් අයදුම්කරුවන් සතුව තිබේදැයි පරික්ෂා කිරීම මෙම පරික්ෂණයේ අරමුණ වේ.<br><br>**තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප**<br>(අ) පරිගණකයේ මූලික කොටස් හා ඒවායේ වැදගත්කම<br>(ආ)දෘඩාංග හා මෘදුකාංග → පද්ධති මෘදුකාංග - උදා:- මෙහෙයුම් පද්ධති (Operation System)<br>→ භාවිත මෘදුකාංග<br><br>**මේ යටතේ බලාපොරොත්තු වන දැනුම හා කුසලතා**<br>(අ) පරිගණකයක් ක්‍රමාණුකූලව පණ ගැන්වීම හා ක්‍රියා විරහිත කිරීම.<br>(ආ)පරිගණක තැටියක පරිගණක ගොණු රාශි (Directory) හා පරිගණක ගොණු (Files ) පිහිටි ආකාරය<br>(ඇ)පරිගණක ගොණු රාශි අළුතින් ඇති කිරීම, එම ගොණු රාශියක අළුතින් ගොණුවක් ඇරඹීම, ගොණු කපා දැමීම (Delete ), පිටපත් කිරීම (Copy ), පිටපත් කළ ගොණු වෙනත් ගොණු රාශියක ඇතුල් කිරීම, ගොණුවක් එක් ගොණු රාශියකින් තවත් ගොණු රාශියකට ගෙන යාම ( Move ), නම වෙනස් කිරිම(Rename). |

| | |
|---|---|
| 02.මුදල් රෙගුලාසි | (ඉ) ගොණු රාශියක අඩංගු ගොණු සංඛ්‍යාව, ගොණුවක විශාලත්වය, ගොණුවක් විවෘත කිරීමට අවශ්‍ය මෘදුකාංග, එය ආරම්භ කළ හෝ යාවත්කාලීන කළ දිනය පිළිබඳ තොරතුරු සොයා ගැනීම.<br><br>(ඊ) මෘදුකාංගයක් නැවත සැකසීම ( Format) |
| 02.විෂයය දැනුම | තනතුරට අදාළ රාජකාරි පිළිබඳ විෂයානුබද්ධ කරුණු ආශ්‍රයෙන් මෙම ප්‍රශ්ණ පත්‍රය සකස් වේ. |

සටහන -

උසස්වීමේ වීමේ පරිපාටිය අනුමත වූ දිනට මෙම තනතුරේ අවම වශයෙන් වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධරයන් එම තනතුරට අදාළ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් (II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්) නිදහස් කරනු ලැබේ. (උසස්වීමේ වීමේ පරිපාටිය අනුමත වූ දිනට පෙර අදාළ තනතුරට පත්වීම් ලබා II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිළධරයන් මේ සඳහා සුදුසුකම් ලබයි.)

සකස් කළේ : -
අත්සන ..........................

කේ. ඩබ්. ටී. ඩී. කුමාරසිංහ
අධ්‍යක්ෂ (පාලන) 03 (ශ්‍රී.ලං.ප.සේ.III)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය 2019/10/31

පරීක්ෂා කළේ :
අත්සන ..........................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන ..........................
(සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්)
නම :
තනතුර :
නිල මුද්‍රාව:

වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

යොමු අංකය:NTA/06/MSA/අන්.ග්‍ර/12/2017

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන:..........................
නම: ..........................
ලේකම්.
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
නිල මුද්‍රාව:

වැඩ බලන ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

බී. එම්. හිමල් බාලසූරිය
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය
රාජ්‍ය අමාත්‍යාංශය

දිනය 2019/11/06

~~යොමු අංකය:~~..........................

~~සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය.......................... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.~~

~~අත්සන:~~..........................

~~නම:~~ ..........................

~~ලේකම්.~~

~~රාජ්‍ය සේවා කොමිෂන් සභාව~~

~~දිනය~~..........................

~~නිල මුද්‍රාව:~~

ඇමුණුම 03

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 1 සේවා ගණය ( MN - 02 - 2016(ඒ)) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය

01. විභාගය :- කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 1 සේවා ගණය සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තරය :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. කාර්ය විශේෂිත දැණුම | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : - සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :- වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

01.පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. කාර්ය විශේෂිත දැණුම | පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් හි විෂය නිර්දේශයන්ට ඇතුළත් කරුණු පිළිබඳ අදාළ කරුණු නිළධාරියාගේ දැනුම, කුසලතාවන් ඔහුගේ ජ්‍යෙෂ්ඨතාවට සරිලන පරිදි වැඩි දියුණු වී තිබේද යන්න හා ගත වූ කාලය තුළ එකී ක්ෂේත්‍රයන්හි සිදු වී ඇති නවායකරණයන් පිළිබඳ ඔහු දැනුවත් වී තිබීම පිළිබඳ මැන බැලීම සඳහා වන පරීක්ෂණයකි. |

සටහන - උසස්වීමේ වීමේ පරිපාටිය අනුමත වූ දිනට මෙම තනතුරේ අවම වශයෙන් වසර 25 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධරයන් එම තනතුරට අදාළ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් (III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්) නිදහස් කරනු ලැබේ. (උසස්වීමේ වීමේ පරිපාටිය අනුමත වූ දිනට පෙර අදාළ තනතුරට පත්වීම් ලබා I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිළධරයන් මේ සඳහා සුදුසුකම් ලබයි.)

සකස් කළේ : -
අත්සන ..........................
කේ. එච්. ටී. ඩී. කුමාරසිංහ
අධ්‍යක්ෂ (පාලන) 03 (ශ්‍රී.ලං.ප.සේ.III)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පරීක්ෂා කළේ : -
අත්සන ..........................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරියා)
සෝමපාල මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන ..........................
(සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්)

නම :
තනතුර :
නිල මුද්‍රාව:
වෛ. ඛ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය.....2019/10/31

යොමු අංකය:NTA/06/MSA/අන්.ග්‍ර/12/2017

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා යෝජිත තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය අනුමත කිරීම නිර්දේශ කරමි.

වැඩ බලන ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන:........................................

නම: ........................................

ලේකම්.
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

[illegible] බාලසූරිය
ලේකම්,
සෞඛ්‍ය, [illegible] දේශීය වෛද්‍ය
[illegible] අමාත්‍යාංශය

දිනය. 2019/11/06

නිල මුද්‍රාව:

~~යොමු අංකය:~~........................................

~~සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ - 1 සේවා ගණය( MN - 02 - 2016(ඒ) ) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුර සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේදය........................ දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.~~

~~අත්සන:~~........................................

~~නම:~~ ........................................

~~ලේකම්.~~
~~රාජ්‍ය සේවා කොමිෂන් සභාව~~

~~දිනය~~........................

~~නිල මුද්‍රාව:~~

ඇමුණුම 04

සෞඛ්‍ය ගබඩා භාරකරු තනතුරේ නිළධාරින් සහ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරන ලද සෞඛ්‍ය ගබඩා භාරකරු තනතුරේ නිළධාරින් කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 1 සේවා ගණයට (MN – 02 - 2016(ඒ) )අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුරට අන්තර්ග්‍රහණය කිරීම සඳහා යෝජිත ක්‍රමවේදය

උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක වන නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/2006 (IV) මඟින් ලබාදී ඇති MN - 2-2006 "ඒ" වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන වෛද්‍ය සැපයීම් සහකාර තනතුරේ නිළධාරින් සියලු දෙනාම නව උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ලබා සිටි MN 2-2016 "ඒ" වැටුප් පරිමාණයේ අදාළ ශ්‍රේණිය/සේවා කාලය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ වැටුප පරිවර්ථනය කිරීමේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුව ද, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්ථනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපි වීම මත ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

**( i ) MN 2 – III** ශ්‍රේණිය

(අ) MN 2-2016 "ඒ" වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිළධාරින්.

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුව ද නව උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීම් පරිපටිය අනුව සෙසු සුදුසුකම් සපුරා නොමැති නිළධාරින්.

MN 2 – III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**(ii) MN 2 – II** ශ්‍රේණිය

(අ) MN -2-2016 "ඒ" වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 20 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා අවම වශයෙන් වැටුප් වර්ධක 10 (දහයක්) උපයාගෙන ඇති නව උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිළධාරින්.

(ආ) MN - 2-2016 "ඒ" වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිළධාරින්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලයක වසර 10 ක් සම්පූර්ණ වුව ද නව උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිළධාරින්.

MN 2 – II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**(iii) MN 2 – I** ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක විස්සක් (20) ක් උපයාගෙන ඇති හා නව උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිළධාරින්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක 10 ක් උපයාගෙන ඇති සහ ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිළධාරින්.

(ඇ) MN -2 – 2016 (ඒ) වැටුප් පරිමාණයේ 1 ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක් යටතේ වැටුප් ලබන නිළධාරින්.

MN 2 – I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ : -
අත්සන ..............................

කේ. එච්. ටී. ඩී. කුමාරසිංහ
අධ්‍යක්ෂ (පාලන) 03 (ශ්‍රී.ලං.ප.සේ.III)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය.....2019/10/31

පරීක්ෂා කළේ :
අත්සන ..................................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරියා)

මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 1
සෞඛ්‍ය, පෝෂණ හා ... වෛද්‍ය අමාත්‍යාංශය
385, පූජ්‍ය ...
කොළඹ 10

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ......................................................
(සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්)
නම :
තනතුර :
නිල මුද්‍රාව:

වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

යොමු අංකය:NTA/06/MSA/අන්.ග්‍ර/12/2017

සෞඛ්‍ය ගබඩා භාරකරු තනතුරේ නිළධාරින් සහ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරන ලද සෞඛ්‍ය ගබඩා භාරකරු තනතුරේ නිළධාරින් කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය ඛණ්ඩ - 1 සේවා ගණයට (MN – 02- 2016(ඒ)) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුරට අන්තර්ග්‍රහණය කිරීම සඳහා යෝජිත ක්‍රමවේදය අනුමත කිරීම නිර්දේශ කරමි.

වැඩ බලන ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන:..................................................
නම: ..................................................
ලේකම්.
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

දිනය..2019.11.06...
නිල මුද්‍රාව:

බී. එම්. නිමල් බාලසූරිය
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය
රාජ්‍ය අමාත්‍යාංශය

~~යොමු අංකය~~:........................................

~~සෞඛ්‍ය ගබඩා භාරකරු තනතුරේ නිළධාරින් සහ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කරන ලද සෞඛ්‍ය ගබඩා භාරකරු තනතුරේ නිළධාරින් කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 1 සේවා ගණයට (MN – 02- 2016(ඒ)) අයත් වෛද්‍ය සැපයීම් සහකාර තනතුරට අන්තර්ග්‍රහණය කිරීම සඳහා යෝජිත ක්‍රමවේදය~~ ............................ ~~දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.~~

~~අත්සන~~:..................................................
~~නම~~: ..................................................
~~ලේකම්.~~
~~රාජ්‍ය සේවා කොමිෂන් සභාව~~

~~දිනය~~..........................
~~නිල මුද්‍රාව~~: